# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආරක්ෂණ පියවර

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා සහ එම නිෂ්පාදන මත ආරක්ෂණ පියවර ගැනීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් 2017 නොවැම්බර් මස 25 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ඔක්තෝබර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[218 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 51.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010495—510 (2017/11)

# ආරක්ෂණ පියවර

එල්. ඩී.—ඕ. 69/2016

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා සහ එම නිෂ්පාදන මත ආරක්ෂණ පියවර ගැනීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

1947 තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතියට (ගැට් 1947) ශ්‍රී ලංකාව ආරම්භක ගිවිසුම් පාර්ශ්වයක් වූ හෙයින් ද:

ගැට් 1947 පාය මත පදනම් වූ සහ 1994 අප්‍රේල් මස අත්සන් තබන ලද 1994 තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතියට වෙනත් කරුණු අතර, ආරක්ෂණ පියවර පිළිබඳ ගිවිසුම ද ඇතුළත් වූ හෙයින් ද:

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන මත ආරක්ෂණ පියවර පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සැදීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

**1.** මේ පනත 2017 අංක ............. දරන ආරක්ෂණ පියවර පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් නියෝගයක් මගින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

*ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම.*

**2.** (1) සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදන නිපදවන දේශීය කර්මාන්තවලට බරපතල හානියක් සිදුවන හෝ සිදු කිරීමට තර්ජනයක් ඇතිවන ආකාරයෙන් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය, දේශීය නිෂ්පාදනයට පරම වශයෙන් හෝ සාපේක්ෂව විශාල ප්‍රමාණයන්ගෙන් සහ එම කොන්දේසි යටතේ ආනයනය කරනු ලබන බවට සහ ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම මහජන යහපත උදෙසා වන කාර්යයක් වන බවට, මේ පනතේ විධිවිධානවලට අනුව ආරම්භ කොට පවත්වනු ලබන විමර්ශනයකට පසුව (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන මත, ආරක්ෂණ පියවර අදාළ කරගනු ලැබිය හැකි ය.

2—PL 010346—475 (2017/09)

(2) ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම, අත්හිටුවීම හෝ ඉල්ලා අස්කර ගැනීම පිළිබඳ තීරණ ගැනීම සහ ආරක්ෂණ පියවර අදාළ කරගනු ලබන කාලසීමා වෙනස් කිරීම හෝ දීර්ඝ කිරීම (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තර්-අමාත්‍යාංශ කමිටුවේ වගකීම විය යුතු ය.

කමිටුවේ සංයුතිය.

3. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) කමිටුවේ සභාපති විය යුතු අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඇ) කාර්මික සංවර්ධනය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඈ) අභ්‍යන්තර වෙළෙඳාම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඉ) කෘෂිකර්මාන්තය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඊ) විදේශ කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(උ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයකු; සහ

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද, මේ පනත යටතේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවේ ස්වභාවය සලකා බලමින් සහ සභාපතිවරයා විසින් උචිත යැයි සලකන අවස්ථාවක ඔහු විසින්, (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල දක්වා ඇති සාමාජිකයන් විමසා, කමිටුවට දෙදෙනකුට වැඩි නොවන තවත් සාමාජිකයන් සංඛ්‍යාවක් තෝරා ගත හැකි ය.

(3) කමිටුවේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු කමිටුවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු අතර, එවැනි රැස්වීමකට සභාපතිවරයා නොපැමිණෙන්නේ නම් එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් යම් සාමාජිකයකු, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලැබිය යුතු ය.

(4) කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතරක් විය යුතු අතර, රැස්වීම් පැවැත්වීමේ පටිපාටිය සහ එහි කටයුතු කරගෙන යාම කමිටුව විසින් නියාමනය කරනු ලැබිය යුතු ය.

බරපතල හානි.

**4.** (1) මේ පනතේ කාර්යය සඳහා, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයක් වැඩි වශයෙන් ආනයනය කිරීම මගින් දේශීය කර්මාන්තයට බරපතල හානියක් සිදු වී ඇද්ද නැතහොත් එවැනි හානියක් සිදුවීමේ තර්ජනයක් ඇද්ද යන්න තීරණය කිරීම, එම දේශීය කර්මාන්තය පිළිබඳව වූ සියලු අදාළ කරුණු සම්බන්ධ විෂය මූලික සහ ප්‍රමාණාත්මක ස්වභාවයේ ඇගයීමක් සහ විශේෂයෙන් ම පහත දැක්වෙන කරුණු පිළිබඳ ඇගයීමක් මත පදනම් විය යුතු ය:–

(අ) සමාන හෝ සෘජුව තරගකාරී නිෂ්පාදනවල දේශීය නිෂ්පාදනයට පරම සහ සාපේක්ෂ වශයෙන් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයනවල වැඩිවීමේ අනුපාතය සහ ප්‍රමාණය;

(ආ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ වැඩි වූ ආනයනය මගින් අත්කර ගත් දේශීය වෙළෙඳපළේ කොටස;

(ඇ) නිෂ්පාදනය, ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම, ඉන්වෙන්ටරි, අලෙවිය, මිල ගණන් (ආනයනවල වැඩිවීමක් නොමැති විටක දී, අන්‍යාකාරයෙන් සිදු විය හැකි දේශීය මිල ඉහළ යාමෙහි වන අඩුබව වැනි), ඵලදායීතාව, ලාභ සහ පාඩු, ආයෝජන ප්‍රතිලාභ, මුදල් ගලනය සහ සේවා නියුක්තිය වැනි ආර්ථික දර්ශකවල වෙනස්කම් මගින් ප්‍රකට කෙරෙන සමාන හෝ සෘජුව තරගකාරී නිෂ්පාදනවල දේශීය කර්මාන්තය මත ඇති අනුගාමී බලපෑම;

(ඈ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදන වැඩි වශයෙන් ආනයනය කිරීම හැර දේශීය කර්මාන්තයට බරපතල හානි සිදු කරන හෝ සිදු කිරීමට තර්ජනය කරන, එහෙත් එම හානිය ආනයන වැඩි වීමකට දායක නොවන වෙනත් යම් කරුණු.

(2) බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් හෝ බරපතල හානියක් පිළිබඳ තීරණයක්, අදාළ නිෂ්පාදනයේ ආනයන වැඩිවීම සහ බරපතල හානියක් පිළිබඳ තර්ජනය හෝ බරපතල හානිය අතර හේතුකාරක සබඳතාවයක් පැවතීම මගින් පෙන්නුම් කෙරෙන විෂය මූලික සාක්ෂි මත පදනම් විය යුතු ය.

(3) ප්‍රශ්නගත දේශීය කර්මාන්තයට බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් හෝ බරපතල හානියක් ඇති කිරීමට සමාන කාලයක දී, ආනයන වැඩිවීම හැර වෙනත් කරුණු හේතුවන අවස්ථාවක දී, එම බරපතල හානිය එම ආනයන වැඩි වීමට දායක නොවිය යුතු ය. එවැනි අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය වන්නේ නම්, පැමිණිල්ල ප්‍රපාතන විරෝධී හෝ ප්‍රතිතෝලන බදු විමර්ශනයකට යොමු කරනු ලැබිය හැකි ය.

**5.** විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය වැඩි වශයෙන් ආනයනය කිරීම මගින් සිදුවන බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් ඇති බව තීරණය කිරීම සත්‍ය සිද්ධිමය කරුණු මත පමණක් පදනම් විය යුතු අතර, එවැනි තීරණයක් ගැනීමේ දී 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති කරුණුවලට අමතරව පහත දැක්වෙන කරුණු ද සැලකිල්ලට ගත යුතු ය:– බරපතල හානි පිළිබඳ තර්ජනය.

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය, නිෂ්පාදනය කළ හෝ ආරම්භ වූ රටේ හෝ රටවල සත්‍ය සහ විය හැකි අපනයන ධාරිතාව;

(ආ) අපනයනය කළ රටේ හෝ රටවල ඇති යම් ඉන්වෙන්ටරි ප්‍රමාණය;

(ඇ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ අපනයන විශාල ප්‍රමාණයන්ගෙන් දේශීය වෙළෙඳපළට ඇතුළුවීමේ සම්භාවිතාව; සහ

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ යයි සලකනු ලබන වෙනත් යම් සිද්ධිමය කරුණු.

**6.** විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයක් වැඩි වශයෙන් ආනයනය කිරීම මගින් දේශීය කර්මාන්තයට බරපතල හානියක් සිදු වී ඇද්ද නැතහොත් එවැනි හානියක් සිදුවීමේ තර්ජනයක් ඇද්ද යන කරුණු තීරණය කිරීම සඳහා වූ විමර්ශනයක්– ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය.

(අ) දේශීය කර්මාන්තය විසින් හෝ එය වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත; හෝ

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම මෙහෙයවීමෙන් ම,

ආරම්භ විය යුතු ය.

ඉල්ලීමෙහි ඇතුළත් කළ යුතු බවට නියමිත තොරතුරු.

**7.** (1) 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලබන ඉල්ලීමක් මගින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් ඉල්ලුම්කරුට සාධාරණ ලෙස ලබාගත හැකි තොරතුරු සපයනු ලැබිය යුතු ය:–

(අ) ආනයනය කරන ලද නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළු එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරු බදු වර්ගීකරණය සහ එම නිෂ්පාදනයට අදාළ බදු;

(ආ) දේශීය වශයෙන් ඇති සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල තාක්ෂණික ලක්ෂණ සහ එම නිෂ්පාදනවල ප්‍රයෝජන ඇතුළත් එම නිෂ්පාදන පිළිබඳ සම්පූර්ණ විස්තරයක්;

(ඇ) (මෙහි මින් මතු "ඉල්ලීම ඉදිරිපත් කරන ව්‍යවසායන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉල්ලීම ඉදිරිපත් කරන ව්‍යවසායන්වල හෝ ඉල්ලීම කරනු ලබන්නේ යම් ව්‍යවසායක් වෙනුවෙන් ද එම ව්‍යවසායේ නම් සහ ලිපිනයන් සහ දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල හඳුනාගත් වෙනත් සියලුම නිෂ්පාදකයන්ගේ නම් සහ ලිපිනයන්;

(ඈ) ඉල්ලා සිටින ව්‍යවසායන් විසින් නියෝජනය කරනු ලබන සමාන හෝ සෘජුවම තරගකාරී දේශීය නිෂ්පාදනවල ප්‍රතිශත;

(ඉ) ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව ම වූ ලිත් වර්ෂ තුන සඳහා ආනයනය කරන ලද නිෂ්පාදනයේ ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳ තොරතුරු සහ නිෂ්පාදනය ආරම්භ වූ රට විසින් සපයනු ලබන මෑත කාලීන වෙනත් යම් දත්තයන්;

(ඊ) ආනයන වැඩිවීම පිළිබඳ විස්තරයක් සහ විශේෂයෙන් ම එම වැඩිවීම දේශීය නිෂ්පාදනයට පරම වශයෙන් සිදු වී ඇද්ද නැතහොත් සාපේක්ෂව සිදුවී ඇද්ද හෝ එම දෙයාකාරයෙන් ම සිදු වී ඇද්ද යන්න;

(උ) ඉල්ලීම කරන ලද දිනයට පෙරාතුව ම වූ ලිත් වර්ෂ තුන සඳහා දේශීය කර්මාන්තයට සිදු වූ හෝ සිදුවීමේ තර්ජනයක් තිබූ බරපතල හානියට අදාළ තොරතුරු සහ පහත සඳහන් කරුණු ද ඇතුළත්ව වෙනත් යම් මෑත කාලීන දත්තයන්–

(i) බරපතල හානියක් සම්බන්ධයෙන්–

(අ) දේශීය නිෂ්පාදනයේ ප්‍රමාණය සහ වටිනාකම;

(ආ) නිෂ්පාදන ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීම;

(ඇ) ඉන්වෙන්ටරි මට්ටම්වල සිදු වූ වෙනස්වීම්;

(ඈ) වෙළෙඳපළ කොටස;

(ඉ) අලෙවි මට්ටම්වල සිදු වූ වෙනස්වීම්;

(ඊ) දේශීය කර්මාන්තයෙහි සේවා නියුක්තියේ සහ වැටුප්වල මට්ටම;

(උ) මිල මට්ටම්වල වෙනස්වීම්;

(ඌ) ඵලදායීත්වය;

(එ) ලාභ සහ අලාභ;

(ඒ) ආයෝජන මත ප්‍රතිලාභ;

(ඔ) මුදල් ගලනය; සහ

(ඕ) බරපතල තර්ජනයක් පැවතීමට අදාළ විය හැකි වෙනත් යම් තොරතුරු;

(ii) බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් සම්බන්ධයෙන්–

(අ) අපනයන රටවල අපනයන ධාරිතාව;

(ආ) ආනයනය කරන ලද නිෂ්පාදනයට අදාළව ශ්‍රී ලංකාවේ සහ අපනයන රටවල ඇති ඉන්වෙන්ටරි; සහ

(ඇ) තුන්වන රටවල වෙළෙඳපළවලට අපනයනය කිරීම මත පනවා ඇති වෙළෙඳාම පිළිබඳ සීමා කිරීම් ඇතුළු ආනයනවල වැඩිවීමේ සම්භාවිතාව සම්බන්ධයෙන් වූ තොරතුරු;

(ඌ) ඉල්ලීමෙහි අන්තර්ගත තොරතුරු සහ මේ පනත යටතේ වූ නියමයන් සැලකිල්ලට ගැනීමේ දී ආනයන වැඩි කිරීම මගින් බරපතල හානියක් හෝ බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් ඇති බවට තමා විශ්වාස කරන්නේ ඇයි ද යන්න පිළිබඳ හේතු පැහැදිලි කිරීමක්;

(එ) අදහස් කරනු ලබන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතිකවීම පිණිස අවශ්‍ය යයි සලකනු ලබන පියවරවල වර්ගය සහ මට්ටම ද සහිතව, සම්පත් වඩාත් ඵලදායී ප්‍රයෝජන සඳහා යථා පරිදි මාරු කිරීම පහසු කිරීම සඳහා, සහ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම හෝ තරගකාරීත්වය පිළිබඳ නව කොන්දේසි යොදා ගැනීම සඳහා වැනි ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම අපේක්ෂා කිරීම සඳහා වූ විශේෂිත හේතු ලබා දෙන ප්‍රකාශයක්;

(ඒ) (එ) ඡේදයේ සඳහන් අරමුණුවලට අනුකූලව ආනයනවලින් ඇති තරගයට දේශීය කර්මාන්ත වෙනස් කිරීම සඳහා වූ සැලැස්මක්; සහ

(ඔ) තාවකාලික පියවරක් අපේක්ෂා කරන්නේ නම්, ක්‍රියාමාර්ග ගැනීමේ දී සිදුවන ප්‍රමාදයන් නිසා කර්මාන්තයට ප්‍රතිකර්ම යෙදීමට අපහසුවන අලාභ හානි සිදුවන තීරණාත්මක අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් වූ තොරතුරු සහ තාවකාලික පියවරක් වශයෙන් ඉල්ලා ඇති තීරු බදු වැඩි කිරීමේ මට්ටම පෙන්නුම් කරන ප්‍රකාශයක්.

(2) 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම නියම කරනු ලැබිය හැකි ගාස්තු සමග, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ඉල්ලුම් පත්‍රවල පිටපත් සංඛ්‍යාවක් ද සහිතව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) නියම කරන ලද තොරතුරු සැපයීමේ දී උනන්දුවක් දක්වන පාර්ශ්වයන්, විශේෂයෙන් කුඩා සමාගම් මුහුණපාන යම් දුෂ්කරතා පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා සැලකිල්ලක් දැක්විය යුතු අතර, තත් කාර්ය සඳහා පිහිටුවන ලද උපදේශක මණ්ඩලයක් මගින්, ඔවුන් වෙත ප්‍රායෝගික සහායක් ලබා දිය යුතු ය. නැතහොත් සුදුසු අවස්ථාවන්හි දී අවස්ථානුකූලව යම් නිශ්චිත තොරතුරක් ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(4) 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර සකස් කිරීමේ දී අයදුම්කරුවන්ට සහාය වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. එවැනි උපදේශක මණ්ඩලයක් නිර්මාණය කිරීම, පිහිටුවීම සහ ඒ සම්බන්ධයෙන් වූ සියලු කරුණු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

ඉල්ලීමක් ඉල්ලා අස්කර ගැනීම.

**8.** 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක්, විමර්ශනයක් ආරම්භ කිරීමට පෙර ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී එම ඉල්ලීම ඉදිරිපත් නොකළ ලෙස සලකනු ලැබිය යුතු ය.

ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක විමර්ශනයක් ආරම්භ කිරීමට තීරණය කිරීම.

**9.** (1) 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ඉල්ලීමක සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාව සහ ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීමෙන් පසු සහ ආනයන වැඩිකිරීම මගින් බරපතල හානියක් හෝ බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විමර්ශනයක් ආරම්භ කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, විමර්ශනයක් ආරම්භ කිරීමට තීරණයකට එළඹීමට පෙරාතුව, අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන අතිරේක තොරතුරු, ඉල්ලීම කරන ව්‍යවසාය ඇතුළු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(2) 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් විමර්ශනයක් ආරම්භ නොකිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, එසේ විමර්ශනය ආරම්භ නොකිරීම සඳහා වූ හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලීම ඉදිරිපත් කළ ව්‍යවසාය හෝ ඉල්ලීම කරනු ලබන්නේ යම් ව්‍යවසායක් වෙනුවෙන් ද එම ව්‍යවසාය වෙත දැනුම් දිය යුතු ය.

(3) යම් ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු අවස්ථාවක, එම ඉල්ලීම ඔහු වෙත ලැබී දින තිහක කාලයක් ඇතුළත

ආරක්ෂණ විමර්ශනයක් ආරම්භ කළ යුතු ද නැද්ද යන්න පිළිබඳ තීරණයක් ගනු ලැබිය යුතු බවට සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු ලැබේ. ඉල්ලීම සම්බන්ධයෙන් සංකීර්ණ කරුණු අදාළ වන අවස්ථාවක හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අතිරේක තොරතුරු ඉල්ලා ඇති අවස්ථාවක තීරණයකට එළඹීම සඳහා වූ කාලසීමාව තවදුරටත් දින දාහතරක් වූ කාලසීමාවකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් ආරම්භ කළ හැකි බව.

**10.** තමා විසින් විමර්ශනයක් ආරම්භ කිරීම සාධාරණ වන පරිදි, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයන වැඩි කිරීම මගින් දේශීය කර්මාන්තයට හානියක් සිදුවන බවට හෝ හානියක් සිදුවීමේ තර්ජනයක් ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවක, මේ පනත යටතේ සිය මෙහෙයවීම යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් ආරම්භ කරනු ලැබිය හැකි ය.

විමර්ශනයක් ආරම්භ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

**11.** (1) මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණයක් ගනු ලබන අවස්ථාවක, ඔහු විසින් වහාම-

(අ) එම විමර්ශනය පිළිබඳව, ඉල්ලීම සිදුකරනු ලබන ව්‍යවසායන් වෙත සහ උනන්දුවක් දක්වන අනෙකුත් සියලු පාර්ශ්වයන් වෙත ද, අපනයන රටවල අදාළ නියෝජිතයන් වෙත ද දැනුම් දිය යුතු ය; සහ

(ආ) එම ආරක්ෂණ විමර්ශනය ආරම්භ කිරීම පිළිබඳව ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාව තුළ පුළුල් වශයෙන් සංසරණය වන පුවත්පතක භාෂා තුනෙන්ම දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.

(2) පළමුවන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දිනයේ දී විමර්ශනයක් ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) විමර්ශනයකට සහභාගී වීමට කැමති උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින්, විමර්ශනය ආරම්භ කිරීමේ දිනයේ සිට දින පහළොවක කාලසීමාවක් ඇතුළත එම විමර්ශනයට සහභාගී වීමට තම කැමැත්ත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත යැයි සලකනු ලබන අවස්ථාවල දී, මේ උපවගන්තිය යටතේ සහභාගිවීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමට අවසර දී ඇති කාලසීමාවෙන් පසුව වුව ද, යම් විමර්ශනයකට සහභාගි වීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමක් ඔහු විසින් පිළිගනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම විමර්ශනය පිළිබඳව, කමිටුව විසින් සකස් කර ඇති නියමයන්ට අනුකූලව එම කමිටුව වෙත වහාම දැනුම් දිය යුතු ය.

(5) 6 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ඉල්ලීමක් මත මේ පනත යටතේ විමර්ශනයක් ආරම්භ නොකිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණයක් ගනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන තොරතුරු ඇතුළත් දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළ කරවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු යː-

(අ) ඉල්ලීම කරනු ලබන ව්‍යවසායේ අනන්‍යතාවය සහ විමර්ශනයක් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිනු ලබන්නේ යම් දේශීය නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ද, එම නිෂ්පාදනයේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු;

(ආ) බරපතල හානියක් සිදු කර ඇති බවට හෝ බරපතල හානිය පිළිබඳ තර්ජනයක් ඇති බවට කියනු ලබන්නේ ආනයනය කරන ලද යම් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ද, එම නිෂ්පාදනයේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු; සහ

(ඇ) විමර්ශනයක් ආරම්භ නොකිරීමේ තීරණයකට එළඹීම සඳහා වූ හේතු.

විමර්ශනයක් සම්බන්ධයෙන් වූ දැන්වීමක ඇතුළත් විය යුතු කරුණු.

**12.** 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පළකරනු ලබන ආරක්ෂණ විමර්ශනයක් ආරම්භ කිරීම පිළිබඳ දැන්වීමක, පහත දැක්වෙන කරුණු සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් විය යුතු යː-

(අ) විමර්ශනයට භාජන වන නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළු එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරු බදු වර්ගීකරණය හඳුනාගැනීමක් සහ එම නිෂ්පාදනයට අදාළ බදු;

(ආ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල තාක්ෂණික ලක්ෂණ සහ එම නිෂ්පාදනවල ප්‍රයෝජන ඇතුළු එම නිෂ්පාදන පිළිබඳ සම්පූර්ණ විස්තරයක්;

(ඈ) ඉල්ලීම කරනු ලබන ව්‍යවසායකයන් ඇත්නම්, එම ව්‍යසායකයන්ගේ නම් සහ දේශීය වශයෙන් සමාන හෝ ඍජුව ම තරගකාරී නිෂ්පාදනවල හඳුනාගත් වෙනත් නිෂ්පාදකයන්ගේ නම්;

(ඇ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ ආරම්භක රට හෝ රටවල්;

(ඉ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයන වැඩි කිරීමට අදාළ චෝදනාවට පදනම් වී ඇති තොරතුරු සහ එසේ ආනයන වැඩිවීම මගින් සිදු වී ඇති බරපතල හානිය හෝ බරපතල හානිය පිළිබඳ තර්ජනය සම්බන්ධයෙන් වූ තොරතුරුවල සංක්ෂිප්තයක්;

(ඊ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය;

(උ) විමර්ශනයක් ආරම්භවීමේ දිනය වනුයේ ආරක්ෂණ විමර්ශනය ආරම්භවීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනය බවට වූ ප්‍රකාශයක්;

(ඌ) තාවකාලික පියවරක් අදාළ කර ගැනීම සලකා බලනු ලබන්නේ ද නැද්ද යන්න; සහ

(එ) පහත සඳහන් කරුණු ඇතුළුව විමර්ශනයක් පැවැත්වීම සඳහා වූ යෝජිත වැඩසටහන:–

(i) විමර්ශනයට සහභාගිවීමට කැමැත්තෙන් සිටින යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එම කාරණය පිළිබඳව ලිඛිතව දැනුම් දිය හැකි වනුයේ යම් දිනයක හෝ යම් දිනයකට පෙර ද, එම දිනය;

(ii) තාවකාලික පියවරක් අදාළ කරගැනීම සලකා බලනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත තර්ක හෝ කරුණු සැලකිරීම් ඉදිරිපත් කළ හැකි වනුයේ යම් දිනයක දී හෝ යම් දිනයකට පෙර ද, එම දිනය;

(iii) වාචික විභාග කිරීමක් අවශ්‍ය නම්, එවැනි වාචික විභාගයක් ඉල්ලා සිටිය යුත්තේ යම් දිනයක හෝ යම් දිනයකට පෙර ද, එම දිනය; සහ

(iv) තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම පිළිබඳ තීරණය කිරීම සඳහා ද, අදාළ අවස්ථාවන්හි දී, බරපතල හානියක් හෝ බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් සහ ඊට හේතු පිළිබඳව තීරණය කිරීම සඳහා ද, ආරක්ෂණ පියවරක් අදාළ කරගැනීම සම්බන්ධයෙන් වූ වෙනත් යම් තීරණයක් ගැනීම සඳහා ද වූ යෝජිත දින.

විමර්ශනයක් පැවැත්වීමේ කාල සීමාව.

**13.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විශේෂ අවස්ථානුගත කරුණුවල දී හැර, යම් විමර්ශනයක් ආරම්භ කොට මාස හයක් ඇතුළත එම විමර්ශනය පැවැත්වීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය. අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන්නේ නම් මාස හයක කාලසීමාව තවදුරටත් මාස දෙකකට නොවැඩි කාලයකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක දී තාවකාලික පියවර අදාළ කර ගැනීම සලකා බලනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, විමර්ශනය ආරම්භ කිරීමේ දින සිට දින හැටකට පෙර නොවන සහ දින අනූවකට පසු නොවන දිනයක දී එසේ තාවකාලික පියවර අදාළ කර ගැනීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

සාක්ෂි ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන්.

**14.** විමර්ශනයක් පැවැත්වීමේ දී, විමර්ශනයට භාජන වන කරුණු පිළිබඳව ස්වකීය මතය ප්‍රකාශ කිරීමට විමර්ශනයට සහභාගී වී සිටින උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන් වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවස්ථාවක් ලබා දිය යුතු අතර-

(අ) විමර්ශනයට අදාළව යම් අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අසා ඇති යම් ප්‍රශ්න හෝ සිදුකර ඇති වෙනත් ඉල්ලීම් පිළිබඳව කරුණු සැලකිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට;

(ආ) විමර්ශනයට අදාළ කරුණු පිළිබඳව ස්වකීය මත ඇතුළුව, එම පාර්ශ්වයන් විසින් අදාළ යයි සලකනු ලබන යම් සාක්ෂි ඉදිරිපත් කිරීමට; සහ

(ඇ) ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම පොදු යහපත උදෙසා වන්නේ ද නැද්ද යන්න සම්බන්ධයෙන් ස්වකීය මතය ප්‍රකාශ කිරීමට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම පාර්ශ්වකරුවන්හට සති දෙකක් නොඉක්මවන කාලයක් ලබා දිය යුතු ය.

ඇතැම් තැනැත්තන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇති බලතල.

**15.** (1) මේ පනත යටතේ විමර්ශනයක් පවත්වන විට, එම විමර්ශනය පැවැත්වීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් තොරතුරක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් රේගු නිලධරයකුගෙන්, සමාගමකින්, නැව් බඩු රැගෙන යන්නකුගෙන්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වෙනත් ව්‍යවසායකයකුගෙන් හෝ තැනැත්තකුගෙන් ඉල්ලා සිටිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය ඇතුළත ඉල්ලා ඇති තොරතුරු සැපයීම අවස්ථාවෝචිත පරිදි එම නිලධරයාගේ, සමාගමේ, නැව් බඩු රැගෙන යන්නාගේ හෝ ව්‍යවසායකයාගේ කාර්යය විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවල දී ඔහු විසින්, 14 වන වගන්තිය යටතේ සහ මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ලැබුණු තොරතුරු සත්‍යායනය කිරීම හෝ එම තොරතුරු පිළිබඳ වැඩිදුර විස්තර ලබා ගැනීම සිදු කළ හැකි අතර, එවැනි සත්‍යායනය කිරීමේ ප්‍රතිඵල ඇතුළත් වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා පිළියෙල කළ යුතු ය. එසේ ම, ලැබී ඇති රහස්‍ය තොරතුරු හැර, එම වාර්තාව 19 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ප්‍රසිද්ධ ලිපි ගොනුවෙහි ගොනුකර තැබිය යුතු ය.

(3) එවැනි විමර්ශනයක දී–

(අ) යම් විභාගයක් ඉල්ලා නොමැති නම්, බරපතල හානියක් හෝ බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් හෝ හානියට හේතු තීරණය කිරීම සඳහා යෝජිත දිනයට පෙර මාස එකහමාරක කාලසීමාවක් නොඉක්මවන කාලයක දී, සහභාගි වී උනන්දුවක් දක්වන යම් පාර්ශ්වයක් විසින් විමර්ශනයට අදාළ යයි එම පාර්ශ්වය විසින් සලකනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන්, ලිඛිත තර්ක ඉදිරිපත් කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) විභාගයක් පවත්වනු ලබන්නේ නම්, එම විභාගය පැවැත්වීමට නියමිත දිනයට පෙර දින දහයක කාලසීමාවක් නොඉක්මවන කාලයක දී, සහභාගි වී උනන්දුවක් දක්වන යම් පාර්ශ්වයක් විසින්, විමර්ශනයට අදාළ බවට එම පාර්ශ්වය විසින් සලකනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් ලිඛිත කරුණු සැලකිරීම සහ තොරතුරු ඉදිරිපත් කිරීම කරනු ලැබිය හැකි ය.

(4) සහභාගි වී උනන්දුවක් දක්වන පාර්ශ්වයන් හට-

(අ) විභාගයක් සඳහා ඉල්ලුම් කර නොමැති අවස්ථාවක, ලිඛිත තර්ක ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දී ඇති කාලසීමාව අවසන් වීමෙන් පසු; හෝ

(ආ) විභාගයක් පවත්වනු ලැබූ අවස්ථාවක දී විභාගයෙන් පසු,

අවස්ථානුකූලව, වෙනත් යම් සහභාගි වී උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු සැලකිරීම්වලට තව දුරටත් වූ ලිඛිත ප්‍රතිචාර දැක්වීම සඳහා හෝ විභාගයේ දී ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීම් සහ තොරතුරුවලට ප්‍රතිචාර වශයෙන් තවදුරටත් ලිඛිත තර්ක ඉදිරිපත් කිරීම සඳහා දින දහයක් නොඉක්මවන තව දුරටත් වූ කාලසීමාවක් තිබිය යුතු ය.

රහස්‍ය තොරතුරු.

**16.** (1) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රහස්‍ය ලෙස සැලකීම සඳහා හිමිකම් ඇත්තා වූ, ඉදිරිපත් කරන ලද සියලු තොරතුරු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රහස්‍ය ලෙස තබාගත යුතු අතර, එම තොරතුරු ඉදිරිපත් කළ පාර්ශ්වයේ විශේෂ අවසරය නොමැතිව ඒවා හෙළිකරනු නොලැබිය යුතු ය.

(2) තොරතුරු ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් රහස්‍ය ලෙස නම් කර ඇති, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ හෙළිදරව් කිරීමෙන් ආරක්ෂා කර ඇති සෑම තොරතුරක් ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රහස්‍ය ලෙස සැලකිය යුතු ය.

(3) පහත දැක්වෙන ආකාරයේ තොරතුරු, එම තොරතුරු ඉදිරිපත් කරනු ලබන තැනැත්තා විසින් රහස්‍ය ලෙස නම් කරනු ලැබ ඇත්නම්, (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) වන වගන්තියේ (i) වන ඡේදයට අනුව, රහස්‍ය ආකාරයෙන් සපයන ලද බව සැලකිය යුතු ය:–

(අ) නිෂ්පාදනයක ස්වභාවයට, නිෂ්පාදන ක්‍රියාවලියට, මෙහෙයුම්වලට, නිෂ්පාදන උපකරණවලට හෝ යන්ත්‍රෝපකරණවලට අදාළ ව්‍යාපාර හෝ වාණිජ රහස්;

(ආ) සමාගමක මූල්‍ය තත්වයට අදාළ ප්‍රසිද්ධ කර නොමැති තොරතුරු; සහ

(ඇ) පිරිවැය, ගනුදෙනුකරුවන් හඳුනාගැනීම, අලෙවිය, ඉන්වෙන්ටරි පොත්, නැව්බඩු තොග, යම් නිෂ්පාදනයක් නිපදවීම සහ විකිණීමට අදාළ යම් ආදායමක, ලාභයක, අලාභයක හෝ වියදමක ප්‍රමාණය හෝ මූලාශ්‍රය පිළිබඳ තොරතුරු.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දී ඇති ඇතැම් තොරතුරු සඳහා රහස්‍ය තත්ත්වය ලබා දෙන ලෙස, එවැනි සැලකීමක් ඉල්ලා සිටීම සඳහා වන හේතු ද සමග, තොරතුරු ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීමක් මාර්ගයෙන් ඉල්ලා සිටීමට විමර්ශනයක පාර්ශ්වකරුවකුට හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි ඉල්ලීම් පිළිබඳව ඉක්මනින් සලකා බැලිය යුතු අතර, එසේ රහස්‍ය ලෙස සැලකීමට ඉඩ ලබා නොදෙන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්, ඒ බව තොරතුරු ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත දැනුම් දිය යුතු ය.

(5) විමර්ශනයක පාර්ශ්වකරුවන් විසින් රහස්‍ය ලෙස සැලකීම අපේක්ෂා කරනු ලබන සියලු තොරතුරුවල රහස්‍ය නොවන සාරාංශයක් ඉදිරිපත් කළ යුතු අතර, එම සාරාංශය, රහස්‍ය පිටපතෙහි සපයා ඇති සංඛ්‍යාවල සුචිගත කිරීමක් වශයෙන් හෝ එම ලේඛනයෙහි ලකුණු කරන ලද ඉවත් කිරීම් වශයෙන් දැක්විය යුතු ය. තව ද, එම සාරාංශය මගින් රහස්‍ය ලෙස ඉදිරිපත් කරන ලද තොරතුරුවල අන්තර්ගත කරුණු සාධාරණ ලෙස තේරුම් ගැනීමට ඉඩ සැලැස්විය යුතු ය.

(6) විශේෂ අවස්ථානුගත කරුණුවල දී රහස්‍යභාවය අපේක්ෂා කරන තොරතුරු සාරාංශයකින් දැක්විය නොහැකි බව පාර්ශ්වයන් විසින් පෙන්වා දෙනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවල දී සාරාංශය ලබාදීමට නොහැකි වීමට හේතු පිළිබඳ ප්‍රකාශයක් එම පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද රහස්‍ය නොවන සාරාංශය මගින් එම වගන්තියේ නියමයන් සපුරාලීමට අපොහොසත් වන බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, රහස්‍ය බවට සැලකීම සඳහා කරන ලද ඉල්ලීමට ඉඩ ලබා නොදෙන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවල දී තොරතුරු සපයන තැනැත්තා එම තොරතුරු ප්‍රසිද්ධ කිරීමට අකමැති වන්නේ නම්, තොරතුරු සත්‍ය වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට පෙන්වා දෙනු ලැබ ඇත්තේ නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තොරතුරු සැලකිල්ලට නොගත යුතු අතර, එම තොරතුරු ඒවා ඉදිරිපත් කළ පාර්ශ්වයන් වෙත ආපසු යැවිය යුතු ය.

ලිඛිත තර්ක.

**17.** (1) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව, සහභාගී වී උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්වයන් විසින් කරන ලද ලිඛිත හෝ වාචික ඉදිරිපත්කිරීම්වලට ප්‍රතිචාර ඇතුළුව ලිඛිතව සාක්ෂි සහ තර්ක ද, සහ ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම මහජන යහපත උදෙසා වන්නේ ද නැද්ද යන්න පිළිබඳව වන මතය ද ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් සහභාගි වී උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන් වෙත ලබා දිය යුතු ය.

(2) යම් තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම සලකා බලනු ලබන යම් විමර්ශනයක දී, තාවකාලික ආරක්ෂණ පියවර ගැනීම සඳහා වූ තීරණයට එළඹීම සඳහා අදාළ යම් කරුණක් සම්බන්ධයෙන්, එම තීරණය සඳහා වූ යෝජිත දිනයට පෙර දින පහළොවක කාලසීමාවක් ඇතුළත සහභාගි වී උනන්දුවක් දක්වන යම් පාර්ශ්වයක් විසින් ලිඛිත තර්ක ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

විභාග කිරීම.

**18.** (1) 22 වන වගන්තිය යටතේ තාවකාලික පියවරක් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වූ තීරණය පළ කිරීමෙන් පසු දින පහළොවක කාලසීමාවක් නොඉක්මවන කාලයක් ඇතුළත හෝ තාවකාලික පියවරක් අදාළ කර ගැනීම සලකා බලනු නොලබන අවස්ථාවක, විමර්ශනය ආරම්භ කිරීමෙන් පසු මාස එකහමාරක කාලසීමාවක් නොඉක්මවන කාලයක් ඇතුළත, සහභාගි වී උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් කරනු ලබන යම් ඉල්ලීමක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, විභාගය සඳහා, සහභාගී වී උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන් විසින් තොරතුරු සහ තර්ක වාචිකව ඉදිරිපත් කරනු ලැබිය හැකි දිනයක් නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විභාගයක්, බරපතල හානියක් හෝ එවැනි හානියක් පිළිබඳ තර්ජනයක් සහ එවැනි හානියක් සඳහා හේතු සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා යෝජිත දිනයට පෙර මාස දෙකක කාලසීමාවක් නොඉක්මවන කාලයක දී පවත්වනු ලැබිය යුතු ය.

(3) විභාගයක දී පෙනී සිටීමට අදහස් කරන, සහභාගි වී උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින්, අවම වශයෙන් විභාග දිනයට සති එකක කාලසීමාවකට පෙර විභාගයේ දී පෙනී සිටින ඔවුන්ගේ නියෝජිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.

(4) විභාග කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා මුලසුන දැරිය යුතු අතර, රහස්‍යභාවය සුරකින බවට ඔහු වගබලා ගත යුතු ය. තව ද, සහභාගි වී උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ට ස්වකීය අදහස් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලැබෙන ආකාරයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම විභාග කිරීම් සංවිධානය කරනු ලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාගයේ කටයුතු පිළිබඳ වාර්තාවක් පවත්වා ගෙන යා යුතු අතර, එය යම් රහස්‍ය තොරතුරු හැර 19 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන පොදු ලිපි ගොනුවෙහි ගොනු කරනු ලැබිය යුතු ය.

පොදු ලිපිගොනුව සහ ඊට ප්‍රවේශය.

**19.** (1) මේ පනත යටතේ පවත්වනු ලබන එක් එක් විමර්ශනයකට සහ සමාලෝචනයකට අදාළ පොදු ලිපිගොනුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආරම්භ කොට පවත්වාගෙන යා යුතු ය. 16 වන වගන්තියේ විධිවිධාන යටතේ එම පොදු ලිපිගොනුවෙහි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්-

(අ) විමර්ශනයට හෝ සමාලෝචනයට අදාළ සියලුම ප්‍රසිද්ධ දැන්වීම්;

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලා, ප්‍රශ්න මාලාවලට පිළිතුරු සහ ලිඛිත සන්නිවේදන ඇතුළු සියලුම ලිපිලේඛන;

(ඇ) 15 වන වගන්තිය යටතේ සකස් කරන ලද යම් සත්‍යායන වාර්තාවක් ඇතුළු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සකස් කරන ලද හෝ ලබාගත් වෙනත් සියලු තොරතුරු; සහ

(ඇ) මහජනතාව වෙත හෙළිදරව් කිරීමට උචිත යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන වෙනත් යම් ලේඛන,

තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශනය, සමාලෝචනය සහ එය හේතු කොටගෙන ඇති විය හැකි යම් අධිකරණමය සමාලෝචනයක් පවතින මුළුමහත් කාලසීමාව තුළ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලයේ දී සමාලෝචනය කිරීම සහ පිටපත් ලබා ගැනීම සඳහා පොදු ලිපිගොනුව මහජනතාව වෙත ලබා දිය යුතු ය.

පවත්නා තොරතුරු මත විශ්වාසය තැබීම.

**20.** (1) විමර්ශනයක් පවතින කවර හෝ අවස්ථාවක දී, උනන්දුවක් දක්වන යම් පාර්ශ්වයක් විසින්-

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් ඇතුළත අවශ්‍ය තොරතුරුවලට ප්‍රවේශය ලබා දීම ප්‍රතික්ෂේප කරන, නැතහොත් එම තොරතුරු ලබා නොදෙන අවස්ථාවක දී; හෝ

(ආ) අන්‍යාකාරයකින් විමර්ශනයට සැලකිය යුතු ලෙස බාධා කරන අවස්ථාවක දී,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඉල්ලීමෙහි අන්තර්ගත තොරතුරු ද ඇතුළත්ව පවත්නා තොරතුරු මත පදනම් වෙමින් මූලික හෝ අවසන් තීරණයකට (අස්ත්‍යාර්ථ හෝ නිෂේධනීය) එළැඹිය හැකි ය.

(2) ඉල්ලා ඇති තොරතුරු සැපයීමේ දී උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විශේෂයෙන් කුඩා සමාගම් මුහුණපාන යම් දුෂ්කරතා පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, එබැවින් අවස්ථානුකූලව, යම් ප්‍රායෝගික සහයක් ලබා දීම හෝ යම් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය.

තාවකාලික ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම.

**21.** (1) (අ) ඇතැම් බරපතල අවස්ථානුගත කරුණු ඇති බවටත්, ක්‍රියා මාර්ගයක් ගැනීම ප්‍රමාද වීම මගින් පිළියම් කිරීමට අපහසු අලාභයක් සිදුවිය හැකි බවටත්; සහ

(ආ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයන වැඩිවීම මගින් බරපතල හානි සිදු වී ඇති බවට හෝ එවැනි හානි සිදුකිරීමට තර්ජනයක් ඇති බවට පැහැදිලි සාක්ෂි ඇති බවටත්,

අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, ඔහු විසින් තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කරගනු ලැබීම සඳහා නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) තාවකාලික ආරක්ෂණ පියවරක්, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය ආනයනය කරන වේලාවේ දී ගෙවනු ලැබිය යුතු වූ බද්දක ස්වරූපය ගත යුතු ය. මේ බද්ද වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ගෙවනු ලබන යම් බද්දකට අතිරේකව විය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ නිර්දේශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එම නිර්දේශ මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ ලැබීම මත මුදල් විෂයයභාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයාගේ අදහස් විමසා, තාවකාලික පියවර අදාළ කළ යුතු ද නැති ද යන්න සහ පැනවිය යුතු තාවකාලික බද්දෙහි ප්‍රමාණය තීරණය කරනු ලැබිය යුතු ය.

තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වූ නිවේදනය.

**22.** (1) 21 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වූ තීරණයක් ගනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් එසේ අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවෙහි පුළුල් ලෙස සංසරණය වන පුවත්පතක භාෂා තුනෙන්ම පළකරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම කරනු ලැබිය යුතු අතර, එම දැන්වීමෙහි පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතු ය:–

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළුව එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරුබදු වර්ගීකරණය සහ අදාළ වන බදු හඳුනාගැනීමක්;

(ආ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල තාක්ෂණික ලක්ෂණ සහ ඒවායේ ප්‍රයෝජන ඇතුළත්ව එම නිෂ්පාදන පිළිබඳ සම්පූර්ණ විස්තරයක්;

(ඇ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල හඳුනාගත් සියලුම නිෂ්පාදකයන්ගේ නම්;

(ඈ) විමර්ශනයට භාජනවී ඇති නිෂ්පාදනයේ ආරම්භක රට හෝ රටවල්;

(ඉ) තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම ප්‍රමාදවීම මගින් පිළියම් කිරීම අපහසු වන අලාභයක් සිදුවිය හැකි අන්දමේ ඇතැම් බරපතල අවස්ථානුගත කරුණු ඇති බව තීරණය කිරීම සඳහා වූ පදනම;

(ඊ) විමර්ශනයට භාජනවී ඇති නිෂ්පාදන වැඩි වශයෙන් ආනයනය කිරීම මගින් බරපතල හානියක් සිදු වී ඇති බවට හෝ බරපතල හානියක් සිදු වීමට තර්ජනයක් තිබෙන බවට පැහැදිලි සාක්ෂි තිබෙන බව තීරණය කිරීම සඳහා වූ පදනම;

(උ) තාවකාලික ආරක්ෂණ පියවරක් වශයෙන් යෝජනා කරනු ලබන තීරු බදු වැඩි කිරීමේ ප්‍රමාණය;සහ

(ඌ) තාවකාලික ආරක්ෂණ පියවර අදාළ කර ගැනීමට අදහස් කරනු ලබන කාලසීමාව.

(2) තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමට එරෙහිව තීරණයක් ගෙන ඇති අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ සම්බන්ධයෙන් වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස සංසරණය වන පුවත්පතක භාෂා තුනෙන්ම පළ කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම කරනු ලැබිය යුතු අතර, එහි පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතු යː-

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළුව එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරු බදු වර්ගීකරණය සහ අදාළ වන බදු හඳුනාගැනීමක්;

(ආ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදන හඳුනාගැනීමක්;

(ඇ) තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමට එරෙහිව වූ තීරණයකට එළඹීම සඳහා වූ හේතු පැහැදිලි කිරීමක්; සහ

(ඈ) විමර්ශනය එම අවස්ථාවෙන් අවසන් කරනු ලබන්නේ ද නැතහොත් අවසානයක් දක්වා දිගටම පවත්වා ගෙන යන්නේ ද යන කරුණ පිළිබඳ ප්‍රකාශයක්.

තාවකාලික ආරක්ෂණ පියවරක කාල සීමාව.

**23.** තාවකාලික ආරක්ෂණ පියවරක් සාමාන්‍යයෙන් දින දෙසීයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා අදාළ කර ගත යුතු අතර, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා එම කාලසීමාව අවසන් වීමට පෙර එම පියවර අත්හිටුවනු ලැබිය හැකි ය.

තාවකාලික ආරක්ෂණ පියවරක් සඳහා මුදල් ගෙවීම සහ ආපසු ගෙවීම.

**24.** (1) තාවකාලික ආරක්ෂණ පියවරක් සඳහා වූ මුදල් ප්‍රමාණය චෙක් පතකින් හෝ මුදල් ගෙවීමක් මගින් එකතු කරගනු ලැබීම සහ ගෙවීම සිදු කළ යුතු ය ; නැතහොත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට ලියා අත්සන් කරනු ලබන බැඳුම්කරයක් ඉදිරිපත් කිරීම මගින් හෝ ඔහුගේ නමට මුදල් තැන්පත් කිරීම මගින් සහතික කරනු ලැබිය යුතු ය.

(2) ආනයන වැඩි කිරීම මගින් දේශීය කර්මාන්තයට බරපතල හානියක් සිදුවී ඇති බව හෝ එවැනි හානියක් පිළිබඳ තර්ජනයක් ඇති බව පසුව කරන ලද විමර්ශනයකින් හෙළි නොවන්නේ නම්, තාවකාලික ආරක්ෂණ පියවරක් වශයෙන් අයකර ගනු ලැබූ යම් මුදලක් ආපසු ගෙවනු ලැබිය යුතු අතර, යම් බැඳුම්කරයක් හෝ තැන්පතු මුදලක් කඩිනමින් මුදාහරිනු ලැබිය යුතු ය.

(3) තාවකාලික ආරක්ෂණ පියවර තක්සේරු කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු අතර, බදු එකතු කිරීම සම්බන්ධයෙන් රේගු ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

බරපතල හානියක්, බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් සහ ඒ සඳහා හේතු තීරණය කිරීම.

**25.** (1) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ වැඩි වූ ආනයන මගින් දේශීය කර්මාන්තයට බරපතල හානියක් සිදු වී ඇත් ද නැතහොත් බරපතල හානියක් සිදු කිරීමේ තර්ජනයක් ඇත් ද යන කරුණු, මේ පනතේ 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව සහ විමර්ශනයේ දී හෙළි වූ තොරතුරුවල පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශනයක් අවසන් වීමේදී, අධ්‍යක්ෂ ජනරාල්වරයා පහත දැක්වෙන කරුණු ඇතුළත් වාර්තාවක් පිළියෙල කළ යුතු යː-

(අ) සිද්ධිමය කරුණු සහ නීතිමය කරුණුවල සියලුම අදාළ විසඳිය යුතු ප්‍රශ්න මත එළැඹුණු සොයාගැනීම් සහ නිගමන ඇතුළු අවසාන තීරණය;

(ආ) විමර්ශනයේ දී හෙළිවූ සියලු තොරතුරු පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කරන ලද විසඳිය යුතු ප්‍රශ්න සහ සිද්ධිමය කරුණුවල අදාළත්වය.

(3) (2) වන උපවගන්තිය යටතේ වාර්තාව සකස් කිරීමේ දී, රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතාව කෙරෙහි නිසි සැලකිල්ලක් ලබා දෙනු ලැබිය යුතු ය.

බරපතල හානියක්, බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් සහ ඊට හේතු පිළිබඳව තීරණය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසිද්ධ දැන්වීම සහ නිවේදනය.

**26.** බරපතල හානියක්, එවැනි හානියක් පිළිබඳ තර්ජනයක් සහ ඒ සඳහා වන හේතු සම්බන්ධව අස්ත්‍යාර්ථ හෝ නිෂේධනීය තීරණයකට එළඹුණු වහාම, එම බරපතල හානිය හෝ හානියක් පිළිබඳ තර්ජනය සහ හේතු පිළිබඳව තීරණයේ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවෙහි පුළුල් ලෙස සංසරණය වන පුවත්පතක භාෂා තුනෙන්ම පළ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, එම දැන්වීමෙහි පහත දැක්වෙන තොරතුරු ඇතුළත් විය යුතු යː–

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළත් එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරුබදු වර්ගීකරණය සහ ඊට අදාළ බදු හඳුනාගැනීමක්;

(ආ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළත් එම නිෂ්පාදන පිළිබඳ සම්පූර්ණ විස්තරයක්;

(ඈ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල හඳුනාගත් සියලුම නිෂ්පාදකයන්ගේ නම්;

(ඇ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආරම්භක රට හෝ රටවල්; සහ

(ඉ) විමර්ශනයේදී හෙළිදරව් වූ තොරතුරුවල සංක්ෂිප්තයක්, සලකා බලනු ලැබූ කරුණු සහ ඒවායේ අදාළවීම සහ සිද්ධිමය කරුණු සහ නීතිමය කරුණුවල අදාළ සියලුම විසඳිය යුතු ප්‍රශ්න මත එළැඹ ඇති සොයාගැනීම් සහ නිගමන සහ ඒ සඳහා වන හේතු.

ස්ථිර ආරක්ෂණ පියවර පිළිබඳ පොදු ප්‍රතිපත්ති.

**27.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද වාර්තාව, ස්ථිර ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම සම්බන්ධ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ ද සමග කමිටුව වෙත භාර දිය යුතු ය.

(2) (අ) අනපේක්ෂිත නව තත්ත්වයන්වල ප්‍රතිඵලයක් වශයෙන් ආනයන වැඩි කිරීම් මගින් දේශීය කර්මාන්තයට බරපතල හානියක් හෝ බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් සිදු වී ඇති බවට; සහ

(ආ) ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම මහජන යහපත සඳහා වන බවට,

කමිටුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, (1) වන උපවගන්තියේ දක්වා ඇති ලිපිලේඛන ලැබීමෙන් වැඩකරන දින දහයක කාලසීමාවක් ඇතුළත, ස්ථිර ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම පිළිබඳව කමිටුව විසින් අමාත්‍යවරයා මගින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(3) ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමේ කාල සීමාව සහ මට්ටම, බරපතල හානියක් වැළැක්වීමට හෝ ඊට ප්‍රතිකර්ම යෙදීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා සහ වෙනස් කිරීම් සිදු කිරීමට පහසුකම් සැලසීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය.

අමාත්‍යවරයා විසින් ස්ථිර ආරක්ෂණ පියවර පිළිගැනීමට තීරණය කිරීම.

**28.** කමිටුව විසින් ස්ථිර ආරක්ෂණ පියවර පැනවීම නිර්දේශ කරන අවස්ථාවක, කමිටුවේ එම නිර්දේශ ලැබීමේ දිනයේ සිට වැඩ කරන දින දාහතරක කාලසීමාවක් ඇතුළත, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා, සහ ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගෙන එම ආරක්ෂක පියවර පිළිගනු ලබන්නේ ද නැද්ද යන්න තීරණය කළ යුතු ය.

**ස්ථිර ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම සඳහා වන දැන්වීම.**

**29.** (1) ස්ථිර ආරක්ෂණ පියවර අදාළ කර ගැනීම සඳහා තීරණයක් ගනු ලැබූ අවස්ථාවක, පහත දැක්වෙන තොරතුරු ඇතුළත් දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස සංසරණය වන යම් පුවත්පතක භාෂා තුනෙන්ම පළ කරනු ලැබීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය:–

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ එහි ප්‍රයෝජන ඇතුළු විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහ එම නිෂ්පාදනයේ තීරුබදු වර්ගීකරණය සහ අදාළ බදු හඳුනාගැනීම;

(ආ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල තාක්ෂණික ලක්ෂණ සහ ඒවායේ ප්‍රයෝජන ඇතුළු එම නිෂ්පාදන පිළිබඳ සම්පූර්ණ විස්තරයක්;

(ඇ) දේශීය වශයෙන් සමාන හෝ සෘජුවම තරගකාරී නිෂ්පාදනවල හඳුනාගත් සියලුම නිෂ්පාදකයන්ගේ නම්;

(ඈ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආරම්භක රට හෝ රටවල්;

(ඉ) සලකා බලනු ලැබූ කරුණු සහ ඒවායේ අදාළවීම, සලකා බලන ලද සිද්ධිමය සහ නීතිමය කරුණුවල විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳ කරන ලද සොයා ගැනීම්,එළැඹුණු තීරණ සහ ඒ සඳහා වූ හේතු හෝ බරපතල හානිය හෝ හානිය පිළිබඳ තර්ජනය හෝ ඒ සඳහා වූ හේතු තීරණය කිරීමේ දැන්වීම පිළිබඳ හරස් සටහනක් ඇතුළුව අස්ත්‍යාර්ථ හානිය පිළිබඳ තීරණයේ සංක්ෂිප්තයක්;

(ඊ) ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම මහජන යහපත උදෙසා වන බවට වූ නිගමනයට එළැඹීම සඳහා වූ හේතු;

(උ) දේශීය කර්මාන්තය වෙනස් කිරීමේ සැලැස්මට අදාළ තොරතුරු;

(ඌ) යෝජිත ස්ථිර ආරක්ෂණ පියවරෙහි ආකෘතිය, මට්ටම සහ කාල සීමාව සහ 27 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් නියමයන්ට අනුකූලව ඒ සඳහා වූ පැහැදිලි කිරීමක්;

(එ) ස්ථිර ආරක්ෂණ පියවර අදාළ කර ගැනීමට යෝජිත දිනය;

(ඒ) ප්‍රමාණාත්මක සීමා කිරීමක් යෝජනා කර ඇත්නම්, සැපයුම් රටවල් අතර කෝටා ප්‍රමාණය වෙන් කිරීම සහ වෙන් කිරීම සිදුකරනු ලැබූ පදනම සම්බන්ධයෙන් 31 වන වගන්තියේ සඳහන් නියමයන්ට අනුකූලව පැහැදිලි කිරීමක් සහ අදාළ තොරතුරු;

(ඔ) (යම් තාවකාලික ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමේ කාලසීමාව ද ඇතුළුව) ආරක්ෂණ පියවර සඳහා යෝජිත කාලසීමාව අවුරුදු එකකට වඩා වැඩි නම්, එම පියවර ක්‍රමයෙන් නිදහස් කිරීම සඳහා වූ කාල සටහන; සහ

(ඕ) ආරක්ෂණ පියවරෙන් නිදහස් කරන ලද සංවර්ධනය වෙමින් පවතින රටවල් හඳුනාගැනීමක්.

(2) ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමට එරෙහිව තීරණයක් ගනු ලබන අවස්ථාවක, එම තීරණයට එළඹීම සඳහා වූ සිද්ධිමය සහ නෛතික පදනම සඳහන් කරන දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස සංසරණය වන පුවත්පතක භාෂා තුනෙන්ම පළකරනු ලැබීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

ස්ථිර ආරක්ෂණ පියවරක ආකෘතිය සහ එය අදාළ කර ගැනීම.

**30.** (1) ස්ථිර ආරක්ෂණ පියවරක් සාමාන්‍යයෙන් තීරුබදු වැඩි කිරීමක් වශයෙන් හෝ ආනයන මත ප්‍රමාණාත්මක සීමා කිරීමක් වශයෙන් අදාළ කරගනු ලැබිය යුතු අතර, 31 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ආරක්ෂණ පියවර බලාත්මක වූ දිනයේ දී හෝ එදිනට පසුව ඇතුළු වූ, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ සියලුම ආනයන මත, එම ආනයනවල මූලාශ්‍රය නොතකා, එම ආරක්ෂණ පියවර අදාළ කර ගනු ලැබිය යුතු ය.

(2) ස්ථිර ආරක්ෂණ පියවර තීරු බදු වැඩිකිරීමක් ලෙස අදාළ කරගනු ලබන අවස්ථාවක, එසේ වැඩිකරන ලද තීරු බදු එකතු කර ගැනීම සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු අතර, ප්‍රමාණාත්මක සීමා කිරීමක ආකාරයෙන් ස්ථිර ආරක්ෂණ පියවරක් පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ආනයන සහ අපනයන පාලකවරයා වගකිව යුතු ය.

සංවර්ධනය වෙමින් පවතින ඇතැම් රටවලට ස්ථිර ආරක්ෂණ පියවර අදාළ නොකිරීම.

**31.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටකින් ආරම්භවන, විමර්ශනයට භාජන වන නිෂ්පාදනයේ ආනයන ප්‍රමාණය ශ්‍රී ලංකාවේ විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ සම්පූර්ණ ආනයන ප්‍රමාණයෙන් සියයට තුනකට වඩා වැඩි නොවනතාක් දුරට, එම සාමාජික රටෙන් ආරම්භවන විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයනවලට ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයෙන් සියයට තුනකට වඩා අඩු ප්‍රමාණයක් තනි තනිව ශ්‍රී ලංකාවට ආනයනය කරන සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් ඒකාබද්ධව, ශ්‍රී ලංකාවට එම නිෂ්පාදන ආනයනය කරන මුළු ප්‍රමාණයෙන් සියයට නවයකට වඩා වැඩි ප්‍රමාණයක් ආනයනය කරන අවස්ථාවක, සංවර්ධනය වෙමින් පවතින එම සාමාජික රටවලින් ආනයනය කරනු ලබන එම නිෂ්පාදන මත ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කරගනු ලැබිය හැකි ය.

ස්ථිර ආරක්ෂණ පියවරක් වශයෙන් කෝටා පැනවීම.

**32.** (1) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ ආනයන මත කෝටා පැනවීම මගින් සිදුවන ස්ථිර ආරක්ෂණ පියවරක් මගින්, එම නිෂ්පාදනයේ ආනයන ප්‍රමාණය දැනට සංඛ්‍යාලේඛන ඇති ඉතා මෑතක් නියෝජනය වන්නා වූ වර්ෂ තුන සඳහා සටහන් වී ඇති ආනයන ප්‍රමාණයේ සාමාන්‍යයට වඩා අඩු නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, බරපතල හානියක් හෝ බරපතල හානියක් පිළිබඳ තර්ජනයක් වැළැක්වීම හෝ ඊට ප්‍රතිකර්ම යෙදීම සඳහා වෙනස් මට්ටමක් අවශ්‍ය බවට සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති විට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා, දැනට සංඛ්‍යාලේඛන ඇති ඉතා මෑතක් නියෝජනය වන්නා වූ වර්ෂ තුන සඳහා සටහන් වී ඇති, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ ආනයන ප්‍රමාණයේ සාමාන්‍යයට වඩා අඩු ප්‍රමාණයකට එම නිෂ්පාදනයේ ආනයන ප්‍රමාණය අඩු කරන කෝටා ප්‍රමාණයක් අදාළ කර ගනු ලැබිය හැකි ය.

(3) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය එක් රටකට වැඩි රටවල් ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවට අපනයනය කරනු ලබන අවස්ථාවක, ආනයන මත පනවනු ලබන යම් කෝටා ප්‍රමාණයක් සියලුම සැපයුම් රටවල් අතර වෙන් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් ක්‍රමය කෝටා වෙන් කිරීම සඳහා සාධාරණ ලෙස ප්‍රායෝගික නොවන බවට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනය සැපයීමට මූලික කැමැත්තක් ඇති රටවල් අතර කෝටා ප්‍රමාණය වෙන් කළ යුතු ය. පසුගිය වර්ෂ තුන තුළදී එම රටවල් විසින් විමර්ශනයට භාජන වූ නිෂ්පාදන සපයන ලද අනුපාතය මත කෝටා වෙන් කිරීම පදනම් විය යුතු අතර, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනය වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් බලපෑම් සිදුවී ඇති හෝ බලපෑම් සිදුවන යම් විශේෂ සාධක කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ වන කාලසීමාව.

**33.** (1) ස්ථිර ආරක්ෂණ පියවරක්, 36 වන වගන්තියේ විධිවිධාන යටතේ දීර්ඝ කරනු ලැබුවහොත් මිස, යම් තාවකාලික පියවරක් අදාළ කර ගැනීමේ කාල සීමාව ද ඇතුළුව, අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා අදාළ කර ගත යුතු ය.

(2) යම් තාවකාලික පියවරක් අදාළ කර ගැනීමේ කාල සීමාව ඇතුළුව ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමේ සම්පූර්ණ කාල සීමාව, ආරම්භක අදාළ කර ගැනීමේ කාල සීමාව සහ 36 වන වගන්තිය යටතේ එම කාල සීමාවේ යම් දීර්ඝ කිරීමක් අවුරුදු දහයක කාලසීමාවකට වඩා වැඩි නොවිය යුතු ය.

ක්‍රම ක්‍රමයෙන් ලිහිල් කිරීම.

**34.** අදාළ කර ගැනීමේ කාල සීමාව අවුරුදු එකකට වඩා වැඩි ස්ථිර ආරක්ෂණ පියවරක්, 29 වන වගන්තිය යටතේ ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම සම්බන්ධයෙන් පළ කරන ලද දැන්වීමට අනුකූලව, එහි අදාළවීමේ කාල සීමාව ඇතුළත විධිමත් කාලාන්තර තුළ දී ක්‍රම ක්‍රමයෙන් ලිහිල් කරනු ලැබිය යුතු ය.

සමාලෝචනය කිරීම.

**35.** (1) (යම් තාවකාලික පියවර අදාළ කර ගැනීමේ කාල සීමාව ද ඇතුළුව) ස්ථිර ආරක්ෂණ පියවරක කාල සීමාව අවුරුදු තුනකට වැඩි වන අවස්ථාවක, එම පියවර අදාළ කර ගැනීමේ කාල සීමාව හරි අඩක් ගතවීමට පෙර, අදාළ දේශීය කර්මාන්තය කෙරෙහි ස්ථිර ආරක්ෂණ පියවරේ බලපෑම සමාලෝචනය කිරීම සහ වෙනස්

කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී කර්මාන්තයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම ඇතුළු තත්ත්වය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සමාලෝචනය කළ යුතු ය.

(2) මේ පනතේ 11 සිට 19 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම සමාලෝචනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) සමාලෝචනයේ ප්‍රතිඵල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සකස් කරනු ලබන වාර්තාවක පළ කරනු ලැබිය යුතු අතර, ස්ථිර ආරක්ෂණ පියවර පවත්වාගෙන යන්නේ ද හෝ ඉවත්කර ගන්නේ ද නැතහොත් ලිහිල් කිරීමේ වේගය වැඩිකරන්නේ ද යන්න පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉන් පසු එම වාර්තාව කමිටුවට යොමු කළ යුතු ය.

(4) සමාලෝචනයේ ප්‍රතිඵල සංක්ෂිප්ත වශයෙන් දක්වමින් ස්ථිර ආරක්ෂණ පියවරක් පවත්වාගෙන යාම, ලිහිල් කිරීම හෝ ඉවත් කර ගැනීම සඳහා වූ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය. එම දැන්වීමේ අන්තර්ගත විය යුතු කරුණු, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව , 29 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීම පිළිබඳව වූ දැන්වීම සම්බන්ධයෙන් නිශ්චිතව දැක්වෙන නියමයන්ට අනුකූල විය යුතු ය.

**36.** (1) ස්ථිර ආරක්ෂණ පියවරක් එය අදාළවීමේ මූලික කාල සීමාවෙන් ඔබ්බට අදාළ කර ගැනීමේ අවශ්‍යතාවක් ඇති බවට දේශීය කර්මාන්තය විසින් සලකනු ලබන අවස්ථාවක, එම කාල සීමාව අවසන් වීමට මාස හයකට නොඅඩු කාලයකට පෙර, කර්මාන්තයේ වෙනස්කම් කිරීමේ සැලැස්ම පිළිබඳ සාක්ෂි ද ඇතුළුව, එම දේශීය කර්මාන්තය විසින් එම ආරක්ෂණ පියවර දීර්ඝ කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය. ස්ථිර ආරක්ෂණ පියවරක් දීර්ඝ කිරීම.

(2) දීර්ඝ කිරීමක් අවශ්‍ය වන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් පැවැත්විය යුතු අතර, එම විමර්ශනයේ සහ නිශ්චය කිරීමේ කාර්යය සඳහා, මුල් පියවර අදාළ කර ගැනීම සඳහා මේ පනතේ දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අනුගමනය කළ යුතු ය.

(3) 33 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආරක්ෂණ පියවරක් එක් වරක් පමණක් දීර්ඝ කළ හැකි ය.

(4) යම් බරපතල හානියක් වැළැක්වීම හෝ ඊට ප්‍රතිකර්ම යෙදීම සඳහා ස්ථිර ආරක්ෂණ පියවර දිගටම තබා ගැනීම අවශ්‍ය වන බවට සහ දේශීය කර්මාන්තය වෙනස් වෙමින් පවතින බවට සාක්ෂි ඇති බවට, (2) වන උපවගන්තියේ සඳහන් විමර්ශනයක් හරහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක දී පමණක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්ථිර ආරක්ෂණ පියවරක් දීර්ඝ කිරීමට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැඩ කරන දින දහයක කාලසීමාවක් ඇතුළත ඔහුගේ නිර්දේශ කමිටුව වෙත ලබා දිය යුතු අතර-

(අ) යම් බරපතල හානියක් වැළැක්වීම හෝ ඊට ප්‍රතිකර්ම යෙදීම සඳහා ආරක්ෂණ පියවර දිගටම තබා ගැනීම අවශ්‍ය වන බවට; සහ

(ආ) දේශීය කර්මාන්තය වෙනස් වෙමින් පවතින බවට සාක්ෂි තිබෙන බවට,

කමිටුව විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, එම නිර්දේශ ලැබීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත, කමිටුව විසින් ස්ථිර ආරක්ෂණ පියවරක් දීර්ඝ කරන ලෙස අමාත්‍යවරයා හරහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(6) කමිටුව විසින් ස්ථිර ආරක්ෂණ පියවර දීර්ඝ කිරීමට නිර්දේශ කරන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා, කමිටුවේ නිර්දේශ ලැබීමෙන් වැඩ කරන දින දාහතරක කාලසීමාවක් ඇතුළත, ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් එම ආරක්ෂණ පියවර දීර්ඝ කරන්නේද නැද්ද යන බව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(7) දීර්ඝ කරන ලද ස්ථිර ආරක්ෂණ පියවරක් ආරම්භක අදාළ කර ගැනීමේ කාල සීමාව අවසානයේ දී පැවති තත්ත්වයට වඩා සීමාකාරී නොවිය යුතු ය.

(8) ස්ථිර ආරක්ෂණ පියවරක් දීර්ඝ කිරීම සඳහා පළ කරන ලද දැන්වීමකට අනුකූලව, දීර්ඝ කරන ලද කාලය තුළ දී ද එම

ආරක්ෂණ පියවර ක්‍රම ක්‍රමයෙන් ලිහිල් කරනු ලැබිය යුතු ය. එම දැන්වීම අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 29 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ස්ථිර ආරක්ෂණ පියවරක් අදාළ කර ගැනීමේ දැන්වීම සම්බන්ධයෙන් වූ නියමයන්ට අනුකූල විය යුතු ය.

රහස්‍ය තොරතුරු හෙළිදරව් නොකළ යුතු බව.

**37.** (1) මේ පනත යටතේ පවත්වන ලද විමර්ශනයක දී හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් රැස් කර ගන්නා ලද්දා වූ, 16 වන වගන්තිය යටතේ රහස්‍ය තොරතුරු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති තොරතුරු, මේ පනතේ විධිවිධාන යටතේ හෙළි කරන ලෙස නියම කරනු ලැබුවහොත් හෝ එසේ කිරීමට බලය පවරනු ලැබුවහොත් මිස එම තැනැත්තා විසින් හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් එම උපවගන්තියේ සඳහන් රහස්‍ය තොරතුරු හෙළිදරව් කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරුවන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට නැතහොත් එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ඔහු යටත්විය යුතු ය.

අධිකරණමය සමාලෝචනය.

**38.** මේ පනත යටතේ වූ යම් විමර්ශනයකට හෝ සමාලෝචන කාර්ය පටිපාටියකට සහභාගී වූ හෝ ඒවාට සම්බන්ධතාවක් ඇති යම් පාර්ශ්වකරුවකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ අධිකරණමය සමාලෝචනයක් ඉල්ලා සිටිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලතල පැවරීම.

**39.** (1) මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කර්තව්‍ය සහ බලතලවලින් කිසිවක් ඔහු විසින්, නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂවරයාගේ නිලයට වඩා අඩු නොවන නිලයක් දරන නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් කර්තව්‍යයක් හෝ බලයක් පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද, එම නිලධරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධිවිධානවලට යටත්ව එම කර්තව්‍යය හෝ බලය ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් බලතල පැවරීමක් නොතකා එසේ පවරන ලද කර්තව්‍යය හෝ බලය ඉටු කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ අයිතිය අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබිය යුතු ය.

නියෝග.

**40.** (1) නියම කරනු ලැබිය යුතු යැයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදිය යුතු යැයි මේ පනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකළ යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් සිදු නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**41.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"රට" යන්නට, ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජිකයන් හෝ වෙනත් යම් රටක් හෝ ස්වාධීන රේගු බල ප්‍රදේශයක් අදහස් වේ;

"ඍජුවම තරගකාරී නිෂ්පාදනය" යන්නෙන්, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයට සමාන දේශීය නිෂ්පාදනයක් හෝ ඒ වෙනුවට ආදේශකයක් ලෙස යොදාගත හැකි නිෂ්පාදනයක් අදහස් වේ;

"දේශීය කර්මාන්තය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශ භූමිය තුළ ක්‍රියාත්මක වන්නා වූ ද, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයට සමාන හෝ ඍජුවම තරගයක් ඇති නිෂ්පාදන නිෂ්පාදනය කරන්නා වූ ද නිෂ්පාදකයන් සමස්තයක් වශයෙන් නැතහොත්, ශ්‍රී ලංකාවේ දේශ භූමිය තුළ ක්‍රියාත්මක වන්නා වූ ද, ඔවුන්ගේ සමාන හෝ ඍජුවම

තරගකාරී නිෂ්පාදනවල එකතුව සම්පූර්ණ දේශීය නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් සංයුක්ත වන්නා වූ ද නිෂ්පාදකයන් අදහස් වේ;

"වැඩි කරන ලද ප්‍රමාණය" යන්නට, දේශීය නිෂ්පාදනයට පරම වශයෙන් හෝ සාපේක්ෂ වශයෙන් වූ ආනයනවල වැඩිවීමක් ඇතුළත් වේ;

" උනන්දුවක් දක්වන පාර්ශ්වයන් " යන්නෙන්-

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ අපනයනකරු සහ විදේශීය නිෂ්පාදකයා;

(ආ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයනකරු;

(ඇ) සමාජිකයන්ගෙන් බහුතරයක් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ නිෂ්පාදකයන්, අපනයනකරුවන් හෝ ආනයනකරුවන් වශයෙන් සිටින වෙළෙඳ හෝ ව්‍යාපාරික සංගම්;

(ඈ) අපනයනය කරන රටේ හෝ රටවල ආණ්ඩුව;

(ඉ) දේශීය වශයෙන් සමාන හෝ ඍජුවම තරගකාරී නිෂ්පාදන ශ්‍රී ලංකාවේ නිපදවන නිෂ්පාදකයන්;

(ඊ) තම සාමාජිකයන්ගෙන් බහුතරයක් දේශීය වශයෙන් සමාන හෝ ඍජුවම තරගකාරී නිෂ්පාදන ශ්‍රී ලංකාවෙහි නිපදවන නිෂ්පාදකයන් වන්නා වූ වෙළෙඳ සහ ව්‍යාපාරික සංගම්;

(උ) දේශීය කර්මාන්තයේ සේවකයන්ගේ යහපත වෙනුවෙන් පෙනී සිටින කම්කරු වෘත්තීය සමිති හෝ වෙනත් සංවිධාන;

(ඌ) පාරිභෝගික සංගම්;

(එ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදන කර්මාන්තවල දී භාවිත කරන්නන්;සහ

(ඒ) විමර්ශනයක ප්‍රතිඵලයක් පිළිබඳ ප්‍රමාණවත් සම්බන්ධතාවයක් ඇති තැනැත්තකු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ස්වභාවික හෝ නෛතික තැනැත්තෙක්, අදහස් වේ;

"විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය" යන්නෙන්, ආරම්භ කිරීම පිළිබඳ දැන්වීමෙහි විස්තර කර ඇති පරිදි, මේ පනත යටතේ ආරක්ෂණ විමර්ශනයකට භාජන වී ඇති ආනයනය කරන ලද නිෂ්පාදනයක් අදහස් වේ;

"සමාන නිෂ්පාදන" යන්නෙන්, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයට අනන්‍ය හෝ සියලු ආකාරයෙන් ඊට සමාන දේශීය නිෂ්පාදන හෝ එවැනි නිෂ්පාදන නොමැති අවස්ථාවක දී, සියලු ආකාරයෙන් සමාන නොවුණ ද සමාන භෞතික, තාක්ෂණික හෝ රසායනික ලක්ෂණ තිබීම මගින් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයට බෙහෙවින් සමාන නිෂ්පාදන අදහස් වේ;

"සාමාජිකයා" යන්නෙන්, ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජිකයකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, වෙළෙඳාම පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"සහභාගි වී උනන්දුවක් දක්වන පාර්ශ්වය" යන්නෙන්, මේ පනතේ 11 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව විමර්ශනයකට සහභාගිවීමට සිය කැමැත්ත පෙන්වා ඇති උනන්දුවක් දක්වන පාර්ශ්වයක් අදහස් වේ;

"බරපතල හානියක්" යන්නෙන්, දේශීය කර්මාන්තයක තත්ත්වයට සිදු කරන සැලකිය යුතු සමස්ත හානියක් අදහස් වේ; සහ

"බරපතල හානියක් පිළිබඳ තර්ජනය" යන්නෙන්, පැහැදිලිව ම ආසන්න බරපතල හානියක් අදහස් වේ.

**42.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.